**සිංහල පරිවර්තනය**

## උපාධිධාරීන්ට රැකියා අවස්ථා ලබාදීමේ වැඩ සටහන යටතේ බඳවා ගෙන සංවර්ධන නිලධාරීන් ලෙස සේවය කරන උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් හා උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට බඳවාගත් උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් උතුරු පළා.ත් පාසල් වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට තාවකාලික පදනම මත බඳවා ගැනීම - *2022*

රේඛිය අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/02/29/21/A1/01/2020 හා *2021.12.31*වන දිනැති ලිපිය පරිදි ද, උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ද, උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් ප්‍රදානය කරන ලද අනුමැතිය පරිදි ද, උතුරු පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩ සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට තාවකාලික පදනම මත බඳවා ගැනීමට මෙම නිවේදනය මගින් නියම කර ඇති කොන්දේසීන්ට යටත්ව සුදුසුකම් සපුරා ඇති හා මෙම නිවේදනය මගින් ඉදිරිපත් කර ඇති 4.6වන ජේදය යටතේ සඳහන් කොටසට අන්තර්ගත වන පළාත් රාජ්‍ය සේවයට අයත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා **උතුරු පළාතට අයත් අයදුම්කරුවන්ගෙන් ප්‍රමාණවත් අයදුම්පත් නොලැබෙන විට පමණක්** ලැබෙන අනෙක් අයදුම්පත් පිළිබඳව සැලකිල්ලට ගැනීමට නියමිතව ඇති අතර දිප ව්‍යාප්තව ලැබෙන අයදුම්කරුවන් සඳහා මෙම නිවේදනයේ 4.2(අ) අදාළ වේ.

## *02.* බඳවා ගැනීමේ සේවා කොන්දේසී

*2.1* රේඛිය අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/02/29/21/A1/01/2020 හා *2021.12.31*වන දිනැති චක්‍රලේඛය පරිදි ද, **අංක*1885/38*** දරණ ***2014.10.23***දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයට අදාළ සේවා ව්‍යාවස්ථා සංග්‍රහය මගින් නියම කරන ලද කොන්දෙසීන්, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසින් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක ***1817/30***දරණ ***2013.07.03*** දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත උතුරු පළාත් රාජ්‍ය සේවයට අදාළ ආයතන කාර්ය පටිපාටි සංග්‍රහය යනාදියට යටත්ව, තෝරා ගන්නා විභාග අපෙක්ෂකයන් අදාළ තනතුරට තාවකාලික පදනම මත පත් කරනු ලැබේ.

*2.2* තාවකාලිකව පත්වන දින සිට වර්ෂ තුනක් ඇතුළත ලංකා ගුරු සේවයට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ *7.2.4.1* ප්‍රකාරව පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අපෙක්ෂකයන්ට ස්ථිර ගුරු පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

*2.3* උක්ත විභාගයෙන් සමත් නොවන අයදුම්කරුවන්හට වසරක් තුළ නැවත විභාග පැවැත්වීම හෝ ඔවුන් නැවත පෙර දැරූ තනතුරට පත් කිරීම හෝ උපාධිධාරී අභ්‍යාසලාභීන් සංවර්ධන නිලධාරීන් ලෙස පත් කිරීම හෝ විභාගයෙන් අසමත් වන ඩිප්ලෝමාධාරීන්ගේ සේවය අවසන් කිරීම යන පරිදි කටයුතු කළ යුතුයි.

*2.4* මෙම සේවය ස්ථාන මාරු සහිත සේවයක් වන බැවින් මෙම පත්වීම ලබන අපෙක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි යන කොන්දේසියට යටත් විය යුතුයි.

*2.5* පත්වීම හා පාසල සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන අතර එම තීරණයට අයදුම්කරුවන් යටත්ව් කටයුතු කළ යුතුයි. එම තීරණය සම්බන්ධයෙන් අභියාචනා කිසිවක් ඉදිරිපත් කළ නොහැකිය.

*2.6* *1* ඇමුණුමෙහි සඳහන් පරිදි කලාප මට්ටමින් පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර පත්වීම් ලබන්නන් අදාළ පාසලේ අවුරුදු 10ක් එම පාසලේ සේවය කළ යුතුයි.

*2.7* සම්පූර්ණ කරන පුරප්පාඩු සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලැබේ. නිවේදනය මගින් දැනුම් දී ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් සමහර පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමේ බලතල උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

*2.8* අයදුම්කරු විසින් අයදුම් කරන විෂයය, කුමණ හේතුවක් නිසා හෝ වෙනස් කිරීමට අවස්ථාව නොලැබේ.

**03. වැටුප් පරිමාණය**

රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/02/29/21/A1/01/2020 හා *2021.12.31*වන දින දරණ ලිපියේ, පත්වීම් ලබාදීමේ රෙගුලාසි යන කොටසේ **9** වන වගන්තියට අදාළව ලිඛිත විභාගයෙන් සමත්වී ස්ථිර පත්වීමක් ලබාදෙන විට, ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ **5**වන ඡේදය ප්‍රකාරව වැටුප් ප්‍රදානය කරනු ලැබේ.

එසේ නමුත්, තාවකාලික පත්වීමට රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශිත උපදෙස් පරිදි වැටුප් ප්‍රදානය කරනු ලැබේ.

**04. සාමාන්‍ය සුදුසුකම්**

*04.1* අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

*04.2* (අ) අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු අතර. මෙම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පෙරාතුව වූ වසර හයක (06) කාලපරිච්ඡේදයෙන් අවම වසර තුනක් (03) හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුයි.

**නැතිනම්**

අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාත උපන් ස්ථානය කොටගත් අයවීම හා අවම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි. **(*සම්මුඛ පරීක්ෂණයේදී ඡන්දහිමි නාම ලේඛනයෙන් උපුටා ගන්නා ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුයි)**

**නැතිනම්**

(ආ) දීපව්‍යාප්ත වශයෙන් ඡේද *4.6* යටතේ සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්

*04.3* අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකිවන පරිදි විශිෂ්ට ශාරීරික සෞඛ්‍යයක් තිබිය යුතු අතරම විශිෂ්ට චරිතයක් හිමි පුද්ගලයකු විය යුතුයි.

04.4 *2019.12.31*වන දිනට අයදුම්කරු හට **වයස අවුරුදු 18ට නොඅඩු හා, වයස අවුරුදු 35ට වැඩි නොවිය** යුතුයි.

*04.5* අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම අයදුම්කරු විසින් සුදුසුකම් සියල්ල සපුරා තිබිය යුතුයි..

*04.6* ඉහත සුදුසුකම් සහිතව අයදුම්කරු පහත සඳහන් ගණයේ පත්වීම යටතේ බඳවා ගත් අයදුම්කරුවීම අනිවර්යය වේ.

i. උපාධිධාරීන් රැකියාවන්හි යෙදවීමේ ව්‍යාපෘතිය - *2020* වර්ෂය යටතේ බඳවාගත් අභ්‍යාසලාභී උපාධිධාරියෙකු විය යුතුයි

**හෝ**

ii. 2018 හා *2019* වසරවලදී ක්‍රියාත්මක කළ "අභ්‍යාසලාභී උපාධිධාරීන් හට රජයේ ආයතනවල පුහුණුවක් ලබා දීම " වැඩසටහන යටතේ උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට බඳවාගනු ලැබ *01.01.2020* සහ *01.01.2021* දින සිට සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලැබූ නිලධාරියෙකු විය යුතුයි

**හෝ**

iii. උපාධිධාරීන් රැකියාවන්හි යෙදවීමේ ව්‍යාපෘතිය යටතේ *2020, 2019* සහ *2018* වසරවලදී බඳවා ගන්නා ලද ඩිප්ලෝමාධාරියෙකු විය යුතුයි.

**සටහන : - එක් එක් විෂයයන් සඳහා ප්‍රමාණවත් උපාධිධාරීන් අයදුම් නොකළ විට පමණක් අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩුවලට ඩිප්ලෝමාධාරියෙකුගේ අයදුම්පතක් පරීක්ෂා කර ඉන් අනතුරුව සැළකිල්ලට ගනු ලැබේ..**

## *05.* අධ්‍යාපන සුදුසුකම්

*05.1* උපාධිධාරීන් අංක ***1885/38*** හා ***2014.10.23*** දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඡේදය 13.7 පරිදි අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් ගුරු පත්වීමට අනුමැතිය දුන් විශේෂ විෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමැතියලත් උපාධි ප්‍රදාන ආයතනය මගින් ප්‍රදානය කරන ලද විශ්වවිද්‍යාල උපාධි සුදුසුකම් සහතිකය **(ඇමුණුම -02හි සඳහන් කර ඇති පරිදි)** ලබා තිබීම.

**හෝ**

*05.2* ඇමුණුම 2 හි දක්වා ඇති විෂයයන් ගෙන් එක් විෂයයක් ප්‍රධාන විෂයයන්ගෙන් එකක් ලෙස වසර හතරක කාලපරිච්ඡේදය අධ්‍යයනය කාලපරිච්ඡේදයක් ලෙස සම්පූර්ණ කළ උසස් ජාතික ඩිප්ලෝමාධාරියෙකු විය යුතුයි.

*05.3* *05.1* **හෝ** *05.2* සඳහන් සුදුසුකම් සමග අ.පො.ස (සා/පෙ) විභාගයෙන් සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සමත්වී තිබිය යුතුයි.

## *06.* බඳවා ගැනීමේ ක්‍රමය

*06.1* මෙම නිවේදනය පරිදි පුරප්පාඩු පවතින විෂයයන්ට අයදුම් කරන අයදුම්කරුවන්හට උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙන අතර මෙම සම්මුඛ පරීක්ණයට ලකුණු කිසිවක් ප්‍රදානය කරනු නොලැබේ.. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී මෙම නිවේදනය මගින් කැඳවා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් ප්‍රායෝගික පරීක්ෂණයක් සඳහා අනුමැතිය ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට අනුකූලව බඳවා ගැනීම් ක්‍රියාත්මක කරනු ලැබේ..

*06.2* පුරප්පාඩු වලින් *03%*ක් විශේෂ අවශ්‍යතාවයන් ඇති අයදුම්කරුවන් සඳහා (ආබාධිත) වෙන්කරනු ලැබේ. විභාග අපේක්ෂකයා පත්වීම සඳහා තෝරා ගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීම සඳහා තම ශාරීරික/මානසික සුදුසුකම් බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් ඔප්පු කළ යුතුයි.

## *07.* අයදුම් කිරීමේ ක්‍රමය

*07.1* මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයේ (*21*සෙ.මී x *29*සෙ.මී) කඩදාසියක අංක *1* සිට *07* දක්වා ඇති ඡේද පළමු පිටුවටද,අංක *8* සිට *14* දක්වා දෙවන පිටුවට ද අංක *15* සිට *17* දක්වා .තුන්වන පිටුවට ද *18* සිට *19* දක්වා ඡේද අවසන් පිටුවේද අන්තර්ගත වන පරිදි අයදුම්පත්‍රය සකස් කර ගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2022.05.18** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි,**"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: *393/48,* කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් යොමු කළ යුතුයි.

*07.2* අදාළ විෂයයන් සඳහා වූ අධ්‍යාපන සුදුසුකම් 2වන ඇමුණුමෙන් තෝරා ඔබගේ විෂයයට අදාළ විෂයයන් සඳහා මනාප තේරීම අයදුම්පත්‍රයේ (a) ඡේදයේ සටහන් කර **එක් අයදුම්පත්‍රයක් පමණක්** යොමු කළ යුතුයි.

*07.3* අයදුම්කරුවන් තමන් විසින් අයදුම් කරන විෂයයන් සඳහා පුරප්පාඩු පවතින කලාප 3ක් ප්‍රමුඛතා මට්ටමින් (b) ඡේදයේ සටහන් කළ යුතුයි. එනමුත් අයදුම් කළ කලාපයට පමණක්ම පත් කරන බවට සහතික නොවනු ඇත.

*07.4* අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ නම සඳහන් කරන විට නම පළමුවෙන් ලියා අනෙක් නම්වල අකුරු පසුව සඳහන් කළ යුතුයි.
**උදාහරණයක් වශයෙන්** :- අයදුම්පත්‍රයේ අංක 01ට ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින් KUMAR.K.S යනුවෙන් සඳහන් කළ යුතුයි.

*07.5* අයදුම්පත් යොමු කරන ලිපි කවරයේ වම් පස උඩ කෙළවරේ විභාග සංකේත අංකය වශයෙන් **NP/07/10/01/168** යන අංකය සඳහන් කොට එවිය යුතුයි.

07.6 අයදුම්පත්‍රයේ ඡායාපිටපතක් හෝ අනුපිටපත් යනාදිය භාර ගන්නේ නැති අතර අයදුම්පත්‍රයේ පිටපතක් තමා සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. අයදුම්පත්‍රය පරික්ෂා කිරීමේ පදනම මත උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ පැවැත්වීමට නියමිත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. කෙසේ වුවද සම්මුඛ පරීක්ෂණයට කැඳවීම මත පත්වීම් ලබාදෙන බවට සහතික වන්නේ නැත.

07.7 අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතුරින් සුදුසු යයි හඳුනාගත් අයදුම්කරුවන්හට සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් පොදුවේ නිවේදනයක් හා උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් (www.np.gov.lk) උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා වූ ලිපි උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අයදුම්කරුවන් වෙත යථා කාලයේදී යොමු කරනු ලැබේ. අවම වශයෙන් සම්මුඛ පරීක්ෂණයට දින **03**කට ප්‍රථමයෙන් හෝ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපියක් නොලැබුණු විට ඒ බව පහත සඳහන් ලේඛන සමග **"ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, උතුරු පළාත, සෙම්මනි වීදිය නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැනුම් දිය යුතුයි. (දුරකථන අංකය *–021 2231343 / 0212220039* ෆැක්ස් අංකය *-021 2220794)*

**දන්වන විට ඉදිරිපත් කළ යුතු ලේඛන:-**

ආවරණ ලිපියක්, අයදුම්පත්‍රයේ පිටපතක්, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපිය යොමු කිරීමට ෆැක්ස් අංකයක්.

07.8 **අයදුම්කරුවන් සියළු දෙනාම තම අත්සන සහතික කර ගැනීම අනිවාර්යය වේ.** අයදුම්කරු තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් මාණ්ඩලික නිලධාරියෙකු මගින් ඔබගේ අත්සන සහතික කරවා ගත යුතුයි.

07.9 අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය *18.05.2022* වේ.

## 08. විභාග අපෙක්ෂකගේ අනන්‍යතාවය

විභාග අපෙක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයේදී සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය තහවුරු කළ යුතුයි. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම් පත
(ii) වලංගු ශ්‍රී ලංකා ගුවන් ගමන් බලපත්‍රය.
(iii) වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලේඛනවලින් කුමක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපෙක්ෂකයෙකුට විභාග අපෙක්ෂකත්වය **"ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය, උතුරු පළාත,"** විසින් තම අභිමතය පරිදි ප්‍රතික්ෂේප කළ හැකිය. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් **උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ** ලේකම්වරයා විසින් නියම කරන නීතිරීතින් වලට යටත් විය යුතුයි.

## 9 . අසත්‍ය තොරතුරු සඳහා දඬුවම :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට දැඩි අවධානයකින් යුතුව සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා වූ නීතිරීති ප්‍රකාර කිසියම් අපේක්ෂකයෙකු සම්මුඛ පරීක්ෂණයට ප්‍රථම හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන විට හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව කුමණ අවස්ථාවකදී හෝ වුව ද සුදුසුකම් සම්පූර්ණ කර නැති බවට අනාවරණය වන්නේ නම් අයදුම්කරුගේ සුදුසුකම් එම අවස්ථාවේදීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති යම්කිසි තොරතුරක් අසත්‍ය බවට ඔප්පු වුවහොත් ඕනෑම අවස්ථාවක එම පුද්ගලයා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ඇත

## 10. විභාග සැලැස්ම

### 10.1 සම්මුඛ පරීක්ෂණය

සම්මුඛ පරීක්ෂණයට නියමිත දිනයේ ඉදිරිපත්වීමට අපෙහෝසත් වන අයදුම්කරුවෙකුට වෙනත් දිනයකදී එම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව දෙනු නොලැබේ.

තම සුදුසුකම් සහතික කරන සියළුම ලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට, සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතුයි. එම අවස්ථාවේදී ඉදිරිපත් නොකළ ලිපිලේඛන සම්බන්ධයෙන් පසුව කිසිදු හේතුවක් නිසා හෝ සැළකිල්ල යොමු කරනු නොලැබේ.

***10.2* ප්‍රායෝගික පරීක්ෂණය**

සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් හට ප්‍රායෝගික පරීක්ෂණයට අයදුම්කරු විසින් හඳුනාගත් තේමාව යටතේ ඉදිරිපත් කිරීම් යොමු කළ යුතුයි. පහත සඳහන් පරිදි ලකුණු ප්‍රදානය කරනු ලැබේ..

| **ප්‍රායෝගික පරීක්ෂණයට ලකුණු ලබාදීමේ ධාරිතාව** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| 01. අරමුණ හා ප්‍රවේශය<br>**(Objective and Approach)** | *05* | *02* |
| 02. පෞරුෂත්වය හා හඬපාලනය<br>**(Personality and Voice Control)** | *05* | *02* |
| 03. සන්නිවේදනයේ පැහැදිලිභාවය<br>**(Clarity in the Communication)** | *05* | *02* |
| 04. කාල කළමනාකරණය<br>**(Time Management)** | *05* | *02* |
| 05. ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය<br>**(Usage of Techniques of Presentation)** | *05* | *02* |
| **සම්පූර්ණ ලකුණු ප්‍රමාණය** | ***25*** | ***10*** |

***11.*** මෙම නිවේදනයේ අන්තර්ගත නොවූ යම්කිසි කරුණු ඇතොත් ඒ සම්බන්ධයෙන් හා සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ අවසන් තීරණ ගැනීමේ බලතල උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුව ඇත. එමෙන්ම මෙම නිවේදනයේ දෙමළ හා සිංහල භාෂා මාධ්‍යයන් අතර යම්කිසි අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවක් වෙතොත් එම අවස්ථාවේදී දෙමළ මාධ්‍යයේ නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,**

**ස. තිරුවාකරන්,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
*04.04.2022*